# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011 2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1760 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 27/11/2024 පැය 0600

## මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රාගම පොලිස් ස්ථානය.**

2024.11.26 වන දින උදෑසන කාලයේ රාගම පොලිස් වසමේ වල්පොල දුම්රියපොල අසලදී රාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 240 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 වන වල්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.11.26 වන දින අළුයම් කාලයේ මීගමුව පොලිස් වසමේ ඩීන් හංදිය අසලදී මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 59 මිලිලීටර් 250 ක් (බෝතල් 79)** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වූ තල්ගහවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. දියේ ගිලී අතුරුදහන්වීමක් - මාමඩුව පොලිස් වසම.

2024.11.26 වන දින සවස් කාලයේ මාමඩුව පොලිස් වසමේ එරුපතාන වැවේ පිටවාන අසල **දිය නාමින් සිටි පුද්ගලයෙකු ජල පහරකට හසු වී දියේ ගිලී අතුරුදහන්ව** ඇති බවට මාමඩුව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ පුද්ගලයා වයස අවුරුදු 30 ක් වූ මහකච්චිකොඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම අතුරුදහන් වූ පුද්ගලයා ඔහුගේ තවත් මිතුරන් දෙදෙනෙකු සමඟ දියනාමින් සිටියදී, මෙසේ සැඩපහරට හසුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

පොලිසිය හා ප්‍රදේශවාසීන් එක්ව අතුරුදහන් වූ පුද්ගලයා සොයා මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. මාමඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ඇඹිලිපිටිය පොලිස් වසම.

2024.11.26 වන දින රාත්‍රි කාලයේ ඇඹිලිපිටිය පොලිස් වසමේ ඇඹිලිපිටිය මොරකැටිය මාර්ගයේ මොරකැටිය විහාරස්ථානට අසලදී ඇඹිලිපිටිය දෙස සිට මොරකැටිය දෙසට ධාවනය වූ කාර් රථයක් එම දිසාවටම ඉදිරියෙන් ගමන්ගත් පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 68 ක් වූ ඇඹිලිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - කෑගල්ල පොලිස් වසම.

2024.11.26 වන දින රාත්‍රි කාලයේ කෑගල්ල පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ සියඹලාපිටිය හන්දිය අසලදී කොළඹ දෙස සිට මහනුවර දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට පාලනයකරගත නොහැකිව එම දිසාවටම ඉදිරියෙන් මාර්ගයේ වම්පස නවතා තිබූ ලොරි රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාර් රථ රියදුරු හා ඉදිරිපස අසුනේ ගමන්ගත් පුද්ගලයෙකු කෑගල්ල රෝහලට ඇතුලත් කිරීමේදී රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ ගලිගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කෑගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් කෑගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**